# දැන්වීමයි

## 115 වන උපාධි ප්‍රදාන මහෝත්සවය

### පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, වෛද්‍ය පීඨය සහ
### ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

ප්‍රිය උපාධි අපේක්ෂකයන් වෙත,

දැනට රට තුළ පවතින කොවිඩ් 19 රෝග තත්ත්වය මත සාමාන්‍ය පරිදි උපාධි ප්‍රදාන මහෝත්සවය පැවැත්වීමට ඇති අපහසුවත්, ඒ හේතුව මත අපගේ උපාධිධාරීන්ට උපාධි සහතිකය ලබාගැනීමට සිදුවන ප්‍රමාදයත් සලකා බලා **115 වැනි උපාධි ප්‍රදාන මහෝත්සවය මෙම විශ්වවිද්‍යාලයේ ශ්‍රී ධර්මාලෝක උපාධි ශාලාවේ දී 2020.12.11 දින පෙ.ව. 9.30 ට අනුපස්ථිතියෙහි පැවැත්වීමට** විශ්වවිද්‍යාලය තීරණය කර ඇත.

මෙම උපාධි ප්‍රදාන මහෝත්සවය සඳහා සුදුසුකම් සපුරා ඇති උපාධිලාභින්ගේ නාම ලේඛන මේ වන විටත් කැලණිය විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියට ඇතුළත් කර තිබෙන අතර මෙම උපාධි ප්‍රදාන මහෝත්සවය මාර්ගගත (online) ක්‍රමය යටතේ සජීවිව විකාශනය කිරීමට ද පියවර ගෙන තිබේ.

ඒ අනුව, අදාළ උපාධිධාරීන්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් හෝ මුහුණු පොත (Facebook) හරහා ප්‍රථමවරට අනුපස්ථිතව පැවැත්වෙන මෙම උපාධි ප්‍රදාන මහෝත්සවය සජීවීව නැරඹීමට අවස්ථාව සලසා තිබේ.

***උපාධි ප්‍රදාන මහෝත්සවය පැවැත්වෙන දිනය - 2020.12.11***
***වේලාව - පෙ.ව. 9.30***

තවද, අදාළ උපාධිධාරීන්ට උපාධි සහතිකය ලබාගත හැකි දිනයන්, වේලාවන් සහ උපදෙස් උපාධි ප්‍රදානෝත්සවය නිමවීමෙන් අනතුරුව කැලණිය විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවිය හරහා දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. එදිනම උපාධිධාරීන් වෙත උපාධිලෝගු නිකුත් කිරීම සහ ඡායාරූප සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා ඇති බව ද කාරුණිකව දැනුම් දෙමි.

**ඩබ්ලිව්. එම්. කරුණාරත්න**
**ලේඛකාධිකාරි**
2020-12-04